# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1264/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 03/08/2024<br>පැය 0540 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. බඳින කඳක් ක්‍රියාත්මක වී පුද්ගලයකු මියයාමක් - කැබිතිගොල්ලෑව පොලිස් වසම.**

2024.08.02 වන දින උදෑසන කාලයේ කැබිතිගොල්ලෑව පොලිස් වසමේ දුණුකෙයියා උල්පත ප්‍රදේශයේ ලඳු කැලෑවක් තුල බඳින කඳක් ක්‍රියාත්මක වී පුද්ගලයෙකු තුවාල ලබා කැබිතිගොල්ලෑව රෝහල වෙත ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇති බවට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 48 ක් වන කලවැදි උල්පත, කැබිතිගොල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මරණකරු 2024.08.01 වන දින රාත්‍රියේ එම ප්‍රදේශයේම පදිංචි පුද්ගලයන් දෙදෙනෙකු සමඟ වන සතුන් දඩයමේ ගොස් සිටියදී මෙම අනතුර සිදුව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. කැබිතිගොල්ලෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 02. **හෙරොයින්, අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය.**

2024.08.02 වන දින සවස් කාලයේ කිරිබත්ගොඩ පොලිස් වසමේ හුණුපිටිය අලුත් පාර ප්‍රදේශයේදී බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 42 ක් සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 16 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත. එදිනම සවස් කාලයේදී ගම්පහ පොලිස් වසමේ අකරවිට ප්‍රදේශයේදී එම කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 35 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 33, 41 හා 44 වයස්වල පසුවන පුහුල්වැල්ල, ගම්පහ හා රාගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම සැකකරුවන් සංවිධානාත්මක අපරාධකරුවකු සමඟ සමීප සම්බන්ධතා පවත්වනු ලබන බවට විමර්ශනයේදී අණාවරණය වී ඇත. බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. **හෙරොයින් සමග සැකකරුවකු සහ සැකකාරියක් අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.08.02 වන දින රාත්‍රී කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ දී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීම් 02 ක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු සහ හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර, සැකකාරිය වයස අවුරුදු 29 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ගල්කිස්ස පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. **මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නිකවැරටිය පොලිස් වසම.**

2024.08.02 වන දින දහවල් කාලයේ දී නිකවැරටිය පොලිස් වසමේ බළල්ල ප්‍රදේශයේ දී නිකවැරටිය කොට්ඨාශ අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක්** සන්තකයේ තබා ගෙන සිටි පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන නිකවැරටිය පොලිසිය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 63 ක් වන නිකවැරටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නිකවැරටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**05.** **බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවකු අත්අඩංගුවට - නෝර්වුඩ් පොලිස් ස්ථානය.**

2024.08.02 වන දින සවස් කාලයේ නෝර්වුඩ් පොලිස් වසමේ සෙන්ජොන්ට්ලරි වත්ත ප්‍රදේශයේ දී නෝර්වුඩ් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවකු මැණික් ගැරීමට යොදා ගත් උපකරණ සමග අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 58 ක් වන නෝර්වුඩ් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නෝර්වුඩ් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06.** **මාරක රිය අනතුරක් - දික්වැල්ල පොලිස් වසම.**

2024.08.02 වන දින උදෑසන කාලයේ දික්වැල්ල පොලිස් වසමේ කොළඹ වැල්ලවාය මාර්ගයේ දික්වැල්ල නගරය ආසන්නයේදී තංගල්ල දෙස සිට මාතර දෙසට ධාවනයවූ යතුරු පැදියක් ඉදිරියෙන් එම දිශාවටම ධාවනයවූ ත්‍රීරෝද රථයක පිටුපස ගැටී පෙරළීමෙන් පසු මාතර සෙ සිට තංගල්ල දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයකද ගැටී අනතුරක් සිදුව ඇත. යතුරු පැදියේ ගමන්කළ පැදිකරුගේ බිරිඳ වන පසු පැදිකාරිය අනතුරින් බරපතල තුවාල ලබා බතීගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 49 ක් වූ සීනිමෝදර, නාකුළුගමුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු ඥාතීන්ට භාරදී ඇත. අනතුර සම්බන්ධයෙන් ත්‍රීරෝද රථයේ සහ බස් රථයේ රියදුරන් අත්අඩංගුවට ගෙන ඇත. දික්වැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07.** **මාරක රිය අනතුරක් - අත්තනගල්ල පොලිස් වසම.**

2024.08.02 වන දින සවස් කාලයේ අත්තනගල්ල පොලිස් වසමේ නිට්ටඹුව හංවැල්ල මාර්ගයේ අත්තනගල්ල ප්‍රදේශයේදී නිට්ටඹුව දෙස සිට ඌරාපොල දෙසට ධාවනයවූ වෑන් රථයක ඉදිරියෙන් පැමිණි යතුරු පැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු බරපතල තුවාල ලබා වතුපිටිවල රෝහලට ඇතුලත් කර ප්‍රථිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 49 ක් වූ උඩුගොඩ, රුක්ගහවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වතුපිටිවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් වෑන් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. අත්තනගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**